# මොරගොඩ ගම්මානයේ වාර්ෂිකව පවත්වනු ලබන කිරිහැර පූජාව සම්බන්ධ මානවවංශ අධ්‍යයනයක්

එන්. එස්. සුගතදාස

ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
nishansalasandhamali123@gmail.com

ප්‍රමුඛ පද- දෙවියන්, කිරිහැර පූජාව, මානකන්ද, කිරිබත්, මොරගොඩ ගම්මානය

## හැදින්වීම

බුදුන් පිදීම සේම දෙවි දෙවතාවුන් පිදීම ද, මෙ රට රජ දවස පටන් පැවති ප්‍රධාන ආගමික වතාවකි. ඒ අනුව අතීතයේ සිට මෙ රට ජනතාව තම ගොවිතැන් කටයුතු, පෞද්ගලික කාරනා පදනම් කරගෙන දෙවියන් හට යාඥා කිරීම හා බාරහාර ඔප්පු කරයි. මෙය ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල විවිධ ආකාරයෙන් කරනු ලබයි. ඒ අනුව ඉහත සදහන් ආගමික කාර්යය අනුරාධපුර දිස්ත්‍රික්කයේ මොරගොඩ ගම්මානයේ කරන ආකාරය අධ්‍යයනය කිරීම පර්යේෂණය ඔස්සේ සිදුකරයි.

උතුරුමැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදව්ච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ව මොරගොඩ ගම පිහිටා ඇත. ඈත කාලීන ඉතිහාසයක් ඇති මෙම ගම්මානයෙ ආරම්භයේ සිට අද දක්වා පවත්වාගෙන ආ "කිරිහැර පූජාව" (ගම්බාර දෙවියන්ගේ පූජාව) නම් ආගමික වතාවත තුළ ඇති වැදගත්කම අධ්‍යයනය කිරීම මෙහි පර්යේෂණ ගැටළුව වන අතර, මේ කිරිහැර පූජාව විකාශනය වූ ආකාරයත් ඒහි අන්තර්ගත වතාවත් හා එය සිදුකරන ආකාරය පිළිබඳවත් අධ්‍යයනය කරීම මෙහි මූලික අරමුණ වේ.

## ක්‍රමවේදය

උක්ත පර්යේෂණය සිදු කිරිමේ දි මූලික වශයෙන් දත්ත රැස්කිරීමේ ක්‍රමවේද ලෙස ක්ෂේත්‍ර අධ්‍යයනය, සම්මුඛ සාකච්ඡා පැවැත්වීම හා ඡායාරූප ගැනීම ප්‍රධාන වශයෙන් සිදු කරන ලදි.

## ප්‍රතිඵල සහ සාකච්ඡාව

ගම ආරම්භයට සමගාමී ව මේ ආගමික කටයුත්තත් ආරම්භ වී ඇත (1870 එහා කාලයේ). ආරම්භයට හේතුව වන්නේ, ගමේ ජනතාව විශාල පිරිසක් කෙටිකාලීන ව මිය යාම යි. විශේෂයෙන් ගමේ මහ ඇළින් එහා පැත්තේ කොප්පටියාව කුඹුරුවලට කාන්තාවන් ගිය පසු ඒ අය මියගොස් ඇත. මේ හේතු පදනම්කර ගෙන ගමේ වැඩිහිටියන් විසින් නාවක්කුලම නම් ගමේ පැරණි දෙවියෙකු (දෙවින් ආරූඪවන කෙනෙකු) ගමට ගෙන්වන ලදි. පසුව ගම පට්ටිය (තිස්බබය) අසල මේන්දුව පිහිටුවා ඒ දෙවියා විසින් සමයන් (මායම් වීම) දෙන්නට විය. එහි දී බහිරව දෙවියන්ට ආරූඪ වී කතා කළ පසු දෙවියන් පවසා ඇත්තේ ගම ආරවුල් වෙලා ඇති නිසා එ සම්භන්ධව කතා කිරීමට මානකන්දට (අතු හේන) පැමිනෙන ලෙසයි. එහි දී ද සමයන් දීමෙන් පසු ව වර්ෂයක් පාසා දෙවියන් වෙනුවෙන් එම කන්දට පූජාවන් කරන ලෙසට පවසා තිබේ. ඒ සමගම ගමේ පට්ටිය ස්ථානයේ බෝ ගහක්

හිටුවා එයට කිරිහැර පූජාව කරන්න යැයි පවසා තිබේ. මෙකී හේතු පදනම්කර ගෙන ආරම්භ වූ මෙය අද දක්වා විකාෂණය වී ඇත. කෘෂිකාර්මික ජීවිතයක් ගත කළ ගම් වාසීන් පසුකාලීන ව තවත් හේතු එක්කර ඇත. ඒ අතර ගමේ ආරක්ෂාව, ඉඩකඩම්වල ආරක්ෂාව, වන සතුන්ගේන් ආරක්ෂාව, ලෙඩ රෝග වලට සුවය පතා, අස්වැන්නේ ආරක්ෂාව, ආදිය අන්තර්ගත වේ. එ අනුව මේ සෑම කාරණයක් පාදක කරගෙන සෑම වර්ෂයක ම ඇහැළ මහේ දෙපෝයට පෙර පූජාව පවත්ව යි.

මේ උත්සවය සදහා දින වෙන් කරනු ලබන්නේ ගමේ මුල් අයිතිය තිබෙන දැනුමැති වැඩිහිටියන් විසිනි. සාමාන්‍යයෙන් කෙම්මුර දිනයක් මේ සදහා තෝරා ගනු ලබයි. අදාළ දිනට පෙර දවස් 7,8 කට පෙර මෙසේ දින වෙන් කිරීම කරනු ලබයි. මේ කාලය තුළ ගෙවල ගොම්මැටි ගෑම, වෙනත් උත්සව ගැනීම, කැවුම් ඉවීම, ගස් නැගීම, ආදිය සිදු කරන්නේ නැත. මේ කාලය තුළ ගමේ අවමගුලක්, කොටහළු ගෙයක් වුවහොත් එම ගෙවලින් කිසිවක් නොගනී. හේතුව වන්නේ කිල්ල ය. එසේ ම යම් හෙයකින් එදින හෝ එදිනට පෙර දින ගමේ මළගෙදරක් වුවහොත් සතියකින් පූජාව කල් දමනු ලැබේ. එසේ කල් ඉල්ලීම සිදුකරනු ලබන්නේ කපුමහතා විසිනි. එහි දී බහිරව දෙවියන්ට දුම්මල අල්ලලා පුවක් ගෙඩි තුනක් ගැට ගසා හේතුව පවසා සමාව අය ද නැවත සිදුකිරීම සඳහා බාර වීම සිදුකරනු ලබයි.

අදාල දිනට පෙර දින ගමේ වැඩිහිටියෝ එක් රැස්ව බෝ ගහ යට පිරිසිදු කරයි. එදින ගමේ සියළු දෙනා එතනට පංගුව ගෙනවිත් (හාල්, පොල්, මුදල්) දෙයි. හවස් යාමයේ ගම්බාර දෙවියන්ට කෙම්මුර කිරීම කරයි. එහි දී මොරගොඩ වැවේ (කඩවල) මුට්ටි කුබුක් ගහ යට ශබ්ද පූජාව මගින් දෙවියන්ට දැනුම් දෙනවා අපි හෙට ඔබ වහන්සේට පූජාව සිදුකරන බවට. එසේ ම එම ස්ථානයේ ලිප් බැද කැවුම් ඉවීම සිදුකරයි. පාන්දර සිට පිරිමි පාර්ශවය විසින් කිරිබත් පිසීම සිදුකරයි. තව ද එම කිරිහැර අනුබව කළ හැක්කේ කන්දට ගොස් පැමිණි පසු ය. එසේ ම මේ සඳහා අවශ්‍ය යහන සැකසීම, බහිරව දෙවියන් උදෙසා දානය පිළියෙල කිරීම, අවශ්‍ය කළමනා සූදානම් කිරීම (මල්, පහන්, හදුන්කූරු, පොල්, බුලත්, පුවක්, කැවුම්, කෙසෙල්) මේ කටයුතු සියල්ලම කපුරාලගේ ප්‍රධානත්වයෙන් සිදුකරනු ලබයි. ඔහු ගමේ පතපලවෙනි (පාරම්පරික) උරුමක්කාරයෙක් විය යුතු ය. පසුව උදේ 7.00 ත් 7.30 ත් අතර කාලයේ දවුලෙන් අන බෙර ගසමින් ගමේ අයට බාර ඔප්පු කිරීමට වේලාව හරි බව දැනුම් දෙයි. එවිට ගමේ අය තමන් වුන බාරවලට අදාල කිරිබත්, කැවුම්, මුදල් රැගෙන පැමිණ ඒවා සියල්ල ම එකට තබයි. පසුව ස්වාමීන් වහන්සේ පන්සිල් දී වැඩ ආරම්භ කිරීමට මූලාරම්භය සකස් කරනු ලබයි. මින් පසු කටයුතු බාර වන්නේ කපුමහතාටයි. මෙහි දී පොදුවේ සියළු දෙනාගේ බාර නියෝජනය කරමින් දෙවියන්ට කන්නලව් කරනු ලබයි. එහි දී කපුරාල සමයන් වේ. මෙහි දී දෙවින් උදෙසා අභිනය දීමත් (දවුලෙන් කරන ශබ්ධ පූජාව) මානකන්ද බහිරව දෙවියන්ට හොරණෑ ශබ්ධ පූජාවත් පවත්වයි. පසුව කපුමහතා එතැනට පැමිණෙන සියළු දෙනාගේ නූල් බැදීම, නළලේ පරහද ගෑම සිදුකරයි. පසුව මානකන්ද දෙවියන්ට කිරිහැර රැගෙන යාම සිදුවේ. ඒ සඳහා යහනක් සකසාගෙන (කිරිබත්, මල්, බහිරව දෙවියන්ගේ දානය) පුරුෂ පාර්ෂවයේ කර මතින් දේව භක්තියෙන් මානකන්දට රැගෙන යනු ලබයි. ඒ පසු පස ගමේ ලොකු කුඩා (පිරිමි) සියළු දෙනා තම තමන්ගේ බාර රැගෙන කන්දට යයි. මේලෙස මානකන්දේ නිදන් ගල ආසන්නයට ගොස් නොනවත්වා ඇසෙන දවුල් පූජාව මැද්දේ විශේෂ වූ

චාරිත්‍රයක් සිදු කරනු ලබයි. එනම් යහන රැගෙන එන පිරිමි පාර්ෂවය තුන් වරක් ඉදිරියට පැමිණ දන නැමීම සිදුකරයි. පසුව යහන බිම තබා බුද්ධ ප්‍රතිමා වහන්සේට බුද්ධ පූජාව හා බහිරව දෙවියන්ට දානය ද පූජා කරයි. ඊට අමතරව කිරිබත්, කැවුම්, කෙසෙල් ආදී සියල්ලම පූජා කරයි. මෙහිදීත් කපුරාළ සමයන් දීම සිදුකරයි. ඒ අනුව ගම්බාර දෙවියන්ට වුන බාරය බෙර ශබ්ධ මධ්‍යයේ හඩ නගා කියමින් ඔප්පු කරනු ලබන අතර ඉදිරියටත් ගම ආරක්ෂා කර දෙන මෙන් දෙවියන්ගෙන් ඉල්ලා සිටී. පසුව සියළු දෙනා ම එකට හිඳ කිරිබත්, කැවුම්, කෙසෙල් අනුබව කරනු ලබයි.

කිරිහැර පූජාව වැදගත් වන තවත් කාරනයක් වන්නේ ගමේ සංහිඳ අසල ඒ වෙලේ ම පුල්ලේයාර් දෙවියන් වෙනුවෙන් කරන පුල්ලේයාර් වැදීමයි. මෙයත් පිරිමි පාර්ෂවය විසින් සිදුකරයි. එම කිරිබතට මුද්දරප්පලම්, හකුරු, රටඉඳි ආදිය එක්කර කරගනී. පසුව දේව රූපය ඉදිරියෙන් ගොටු දෙකක් ගසා එයට කිරිබත්, කැවුම්, කෙසෙල් දමා පූජා කරයි. එම ගොටු දෙක අනුබව කළ හැක්කේ පිරිමි ළමුන්ට ය. අනතුරු ව සියළු දෙනාට කෙසෙල් කොළවලට කිරිබත්, කැවුම්, කෙසෙල් ගෙඩි ලබා දෙයි. මෙලෙස දෙවියන් පිදීමෙන් තම ගොවිතැන් කටයුතු ආරක්ෂා කිරීම, වැඩි අස්වැන්නක් ලබා ගැනීම, නිසිකලට වැසි වැටීම ආදිය බලාපොරොත්තු වී ඇත. තව ද එකතු කරන ලද පංගුවෙන් ගමේ සියළු දෙනාට ඒ දින දවල් ආහාරය සාදයි. අමුණ කොළ අනිවාර්ය ව්‍යන්ජනයක් වේ. නෙළුම් කොළේ දමා ගෙන එකදිගට පැදුරු එලා වාඩි වී සියළු දෙනා අනුබව කරයි. මේ සඳහා ගමට සම්බන්ධ නෑදෑ ගම්වල අය ද සහභාගී වෙයි. මේ ආකාරයට කිරිහැර පූජාව පවත්වනු ලබයි. මේ අනුව ගම, එහි මිනිසුන්, ඉඩකඩම් ආදි සියළු දේ දෙවියන් විසින් ආරක්ෂා කර දෙන බවට විස්වාසය තබා ඒ වෙනුවෙන් දෙවියන්ට කරන කෘතගුණ සැළකීමක් වශයෙන් මෙම කිරිහැර පූජාව දැක්විය හැක.

මෙම පූජාව මගින් ගම්වාසීන්ගේ සහයෝගය සංහිඳියාව යහපත් ආකල්ප වර්ධනය සිදු වේ. එසේ ම අතීතය හා බැඳි චාරිත්‍ර ඉදිරියට පවත්වාගෙන යාමටත් රැක ගැනීමටත් හදවතින්ම බැදෙනු ලබන මානවවංශ විද්‍යාත්මක වැදගත් ක්‍රියාවක් බව පෙනීයයි.

**සම්මුඛ සාකච්ඡා**

වී. ධනපාල, මොරගොඩ දී, 2017/01/01